# පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ආදි ශිෂ්‍ය සංගමය
# 77 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තා කෙටුම්පත

දිනය : 2025 මාර්තු 23 වැනි ඉරු දින

ස්ථානය : පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ප්‍රධාන ශාලාව

වේලාව : පෙ.ව. 09.45 ට

මුලසුන :
1. එම් රූපසිංහ මහත්මිය - ගරු සභාපති/විදුහල්පති
2. ජීවන් ප්‍රියදර්ශන යාපා මහතා - ගරු විධායක සභාපති
3. චරිත් ලියනගේ මහතා - ගරු ප්‍රධාන ලේකම්
4. ප්‍රගීත් රුක්ෂාන් මහතා - ගරු භාණ්ඩාගාරික
5. ප්‍රභාත් ඉන්දික මහතා - ගරු නියෝජ්‍ය සභාපති
6. දීපාල් හේරත් මහතා - ගරු හිටපු විධායක සභාපති
7. ජනකාන්ත ලකෂ්මන් මහතා - ගරු උප සභාපති
8. ගිහාන් අබේරත්න මහතා - ගරු උප සභාපති
9. ශාලක මුතුතන්ත්‍රි මහතා - ගරු උප සභාපති
10. රුසිරු වගීෂ මහතා - ගරු උප සභාපති
11. දිමුතු කුමාර මහතා - ගරු උප භාණ්ඩාගාරික
12. චාන්දනි වේරගල මහත්මිය - ගරු නියෝජ්‍ය ලේකම්
13. ධනංජ ඇල්විටිගල මහතා - ගරු සංස්කාරක

ඇතුලු සාමාජිකයන් 129 ක් පමණ සහභාගී වී ඇති බවට අත්සන් ලේඛනයෙන් තහවුරු කරගන්නා ලදී.

**77.1 ආරම්භය**

- **ආගම සිහිකිරීම.**

සියලු සාමාජිකයින් පංචශිලයේ පිහිටුවා ආගමානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

ශ්‍රිමත් අනාගාරික ධර්මපාලතුමන් ඇතුලු මියගිය ජාතික වීරවරයන්, මියගිය රණවිරුවන් සහ අප අතරින් වෙන්වු දම්පල් ප්‍රජාවට අයත් සියලුම දෙනා සිහිකොට විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වමින් ගරු බුහුමන් දක්වන ලදි.

- **පාසල් ගීතය ගායනය**

විද්‍යාලයීය ගීතය ගායනය සඳහා මහා සභා රැස්වීම වෙත පැමිණි සියලුම ආදි ධර්මපාලයයීන් එක්විය.

## ගරු ප්‍රධාන ලේකම්තුමා විසින් 76 වන මහා සභා වාර්තාව ඉදිරිපත් කිරීම.

සංශෝධන කිසිවක් නොවුයෙන් එම සභා වාර්තාව චාන්දනි වේරගල මහත්මියගේ හා ආසිරි ද සොයිසා මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. සභා සම්මිත වු එම වාර්තාව ඇමුණුම් අංක 01 ලෙස මේ සමග අමුණා ඇත.

## විධායක සභාපති ජීවන් ප්‍රියදර්ශන යාපා මහතා විසින් පසුගිය වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදි.

**එම ප්‍රගති වාර්තාව ඇමුණුම් අංක 02 ලෙස මේ සමග අමුණා ඇත. එහි සංක්ෂිප්තය**

- ✓ 2024-2026 වර්ෂය සඳහා තේරි පත් වු විධායක සභාව
- ✓ අනුශාසක මණ්ඩලයේ හා විනය කමිටු නාම ලේඛනය
- ✓ 2024-05-17 වන දින සිට පැවැත්වු විධායක කමිටු රැස්වීම් සහ සාමාජික පැමිණිමේ ලේඛනය

- ✓ විධායක සභාවේ පුරප්පාඩු පිරවීම
- ✓ පසුගිය වර්ෂය තුළ සාමාජිකත්ව සමුගැනීම්
- ✓ 2024-2025 පරිපාලන වර්ෂයේ සංගමයේ ක්‍රියාකාරීත්වය
    - i. පාසලේ භෞතික සම්පත් නඩත්තුව හා නවීකරණ කටයුතු
    - ii. පාසලේ අධ්‍යාපන හා විෂය සමගාමි ක්‍රියාකාරකම් සඳහා දක්වන ලද සහයෝගයන්
    - iii. පළමු ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීම
    - iv. ක්‍රීඩා සංවර්ධනය සඳහා ලබාදුන් සහයෝගයන්
    - v. ආදි ශිෂ්‍ය සංගමයේ රැස්වීම් ශාලාව නවිකරණය
    - vi. ආදි ශිෂ්‍ය සංගමයේ මූල්‍ය උත්පාදන ව්‍යාපෘති
    - vii. ආදි ශිෂ්‍ය සුහදතාව වර්ධනය
    - viii. ආදි ගුරුවරුන් හා ආදි සිසුන් සම්බන්ධිකරණය
    - ix. පාසලේ වාර්ෂිකව ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා දායකත්වය
    - x. පාසල හා ආදි ශිෂ්‍ය සංගමය සම්බන්ධ ප්‍රචාරනය කටයුතු
    - xi. ප්‍රජා සත්කාරක වැඩසටහන්
- ✓ ප්‍රගති වර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව පළමු ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කරගැනීම සඳහා වූ කමිටුවේ ප්‍රධානියා ලෙස කටයුතු කළ දිමුතු කුමාර මහතා හට එම කටයුතු සාර්ථකව අවසන් කිරීම වෙනුවෙන් තම ස්තුතිය පුද කලේය.
- ✓ 2025 මාර්තු මස 28,29,30 යන දින වලදී ධර්මපාල රාහුල මහා ක්‍රිකට් තරගය පැවත්වීමට නියමිත බවත්, රාහුල විද්‍යාලය හා අප පාසල අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිත බවත්, මෙවර ක්‍රිකට් තරගය නිසි ප්‍රමිතියකට අනුව සංවිධානය කිරීමට බලාපොරොත්තු වන බවත් විධායක සභාපති ජීවන් ප්‍රියදර්ශන මහතා සභාවට දන්වන ලදි.
- ✓ ආදි ධර්මපාලයීය රගර් ක්‍රීඩා සමාජය විසින් මෙවර ඔවුන්ගේ ප්‍රගති වාර්තාව ලබා දී නොමැති බවත්, නමුත් ඔවුන් විසින් විශාල මෙහෙයක් පාසල වෙනුවෙන් සිදුකරන බව අප කවුරුත් දන්නා කාරණයක් බවත්, යම්කිසි හේතුවක් නිසා ඔවුන් හට මෙවර ප්‍රගති වාර්තාව ලබාදීමට නොහැකිවන්නට ඇති බවත් පවසා සිටියේය.
- ✓ ආදි ශිෂ්‍ය සංගම් කාර්‍යාලයේ තිබෙන රැස්වීම ශාලාව නවීකරණය කිරීම වෙනුවෙන් පෙරමග දශක කණ්ඩායමට සිය ස්තුතිය ප්‍රකාශ කළේය.
- ✓ ලොතරැයි ව්‍යාපෘතියේ සභාපති ඉන්දික ප්‍රභාත් මහතා හා දිමුතු කුමාර මහතා ඉතා දක්ෂ හා සාර්ථක ලෙස එම ව්‍යාපෘතිය කරගෙන යන බවත් බලාපොරොත්තු වන ඉලක්කය අභිබවා යාමට හැකියාවක් ඇති බව විශ්වාස කරන බවත් පවසා සිටියේය.
- ✓ Maroon Fiesta Mega Carnival ව්‍යාපෘතිය පිළිබඳව මෙම සභා රැස්වීමේ ඉදිරි අවස්ථාවක දී කරුණු ඉදිරිපත් කරන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

## භාණ්ඩාගාරිකතුමා විසින් ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම

ගරු භාණ්ඩාගාරිකතුමා විසින් පසුගිය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටලය ඉදිරිපත් කල අතර, එය දම්පල් නිල වෙබ් අඩවියට 2025-03-17 වැනි දින ඇතුළත් කල බව ප්‍රකාශ කරන ලදී. එසේම එම මූල්‍ය ප්‍රකාශනයේ සාරාංශය, ගිණුම් වාර්තාවෙන් පැන නැගුන කරුණු පිළිබඳවත් පැහැදිලි කිරීමක් කරන සිදුකරන ලදි.

එසේම ගරු විගණකවරුන් ගිණුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් ලබාදුන් මතය ඇතුළත් 2025-03-17 දින වාර්තාව ද සභාවට ඉදිරිපත් කරන ලදි. එසේම තවදුරටත් පහත කරුණු පැහැදිලි කරන ලදි.

- i. ඉතා සිමිත අවස්ථා වලදි හැර හැකි සෑම විටම භාණ්ඩ විකිණීමේ හා මිලදි ගැනීමේ ක්‍රියාවලිය මුදල් පදනම මත සිදුකරන බවත්, හිග මුදල් අයකරගැනිම් හා මුදල් ගෙවීම් කටයුතු සති දෙකක කාලයක් තුල සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදි.
- ii. එමෙන්ම වෙළඳ භාණ්ඩ මිලදී ගැනීමේදී, පෙර බිල්පත් සඳහා සම්පූර්ණයෙන් මුදල් ගෙවා නිම කරන බවත්,
- iii. සංගමයට ලැබිය යුතු මුදල් ලෙස දැක්වෙන බොහෝමයක් ඒවා ඉතා පැරණි ව්‍යාපෘති සඳහා බවත්, ඒවායේ ව්‍යාපෘති සභාපතිවරුන් සමග සාකච්ඡා කොට ඒවා අයකර ගැනීම හෝ කපාහැරිම කළ හැකිදැයි සොයා බලන බවත් ප්‍රකාශ කරන ලදි.

iv. පළමු ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත් කරගැනීමේ දී ඒ සඳහා මුදල් ලබාගැනීම පවත්නා නීති රීති වලට අනුව වරදක් බවත්, එම නිසා මුදල් ආධාර ලබාගැනීම ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සඳහා පමණක් ලබාගත යුතු බවත් යෝජනා විය.

v. දශක හා අනු කණ්ඩායම් වල සාමාජිකත්වය පිරිනැමීම, ආදි ශිෂ්‍ය මව් සංගමයේ සාමාජිකත්වය ලබාගැනීමට යටත්ව සිදුකිරීමට යෝජනා විය.

vi. එමෙන්ම සංගමයේ ගිණුම් කටයුතුවලට සහය දුන් කාර්‍යාලයේ සේවයේ යෙදෙන මහත්ම මහත්මීන්ට තම ස්තුතිය පුද කළේය.

vii. මෙහිදී පැනයක් මතුකරමින් වෙනුර කසුන්සිරි මහතා, ඉදිරි ව්‍යාපෘති වියදම් සඳහා ලැබුණු මුදල් මෙම වසරේ (2024) ආදායමක් ලෙස දක්වා නැත්තේ ඇයි ?දැයි අසා සිටියේය. ඊට පිළිතුරු දෙමින් ගරු භාණ්ඩාගාරික ප්‍රගීත් රුක්ෂාන් මහතා පවසා සිටියේ ගිණුම්කරණ ප්‍රමිත හා ප්‍රතිපත්ති වලට අනුව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ලැබෙන සියලුම මුදල්, වියදම් දරන අවස්ථාව වනතුරු අත්තිකාරමක් ලෙස දැක්විය යුතු බවයි.

viii. ආදි ශිෂ්‍ය සංමයට ලැබෙන මූල්‍ය ප්‍රධානයන්ට අදාළව "විශේෂ අරමුදලක්" පවත්වාගෙන යායුතු බව, වෙනුර කසුන්සිරි මහතා පවසා සිටියේය.

ix. ආදි ශිෂ්‍ය සංගමයට ලැබෙන මුදල් හා පරිත්‍යාග විධායක සභාව යෝජනා කරන හා සාමාජිකයින් අනුමත කරන ව්‍යාපෘති සඳහා යෙදවීම කාලයක් තිස්සේ කරගෙන ගිය ක්‍රමවේදයක් බව දීපාල් හේරත් මහතා පැවසීය.

x. 2023 වසරේ ආදායමට වඩා 2024 ආදායම අඩුවීම, පොළී අනුපාතිකයේ අඩු වීම මත පමණක් සිදු වුවක්ද? එසේ නොමැතිනම් මූල්‍ය උත්පාදන ව්‍යාපෘති සිදු නොකිරීම හේතුවෙන් සිදුවූවක් ද? යන්න හිටපු උප භාණ්ඩාගාරික එම්. එස්. උපාලි මහතා ප්‍රශ්න කර සිටියේය. එහිදි 2024 වර්ෂයේ මැද භාගයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත පොළී අනුපාත වල පහළ යෑම, එනම් තැන්පතු මත ලැබෙන පොළිය දෙගුණයකින් පමණ පහළ යෑම හේතු වු බවත්, වත්මන් බැංකු සමග සාකච්ඡා කොට එය 9.55%, 10% අතර අගයක රඳවාගත් බවත් භාණ්ඩාගාරිකතුමා සභාවට දැනුම් දුන්නේය.

xi. එමෙන්ම කාර්‍යාලයේ වියදම් පියවා ගැනීමට උපකාරයක් ලෙසත්, කණ්ඩායම් වලින් ලබාගන්නා අයකිරීම් වලට සහනයක් ලෙසටත් Mini tuck shop එක ස්ථාපිත කල බවත්, ක්‍රීඩා පිටියේ තරග පැවැත්වෙන දින වලදී එය විවෘතව නොතබන්නේ ඇයි දැයි එම මහතා තවදුරටත් ප්‍රශ්න කර සිටියේය. මෙම ව්‍යාපෘතියේ මූලික යෝජනාව වූයේ උදේ 8 සිට සවස 5/6 වනතුරු Mini tuck shop එක විවෘතව තැබීමට බවත්, මෙහි ආදායම වැඩිකර ගැනීමට අදහසක් නොතිබූ බව පෙනී යන බවත් ඊට අදහස් දක්වමින් ආසිරි ද සොයිසා මහතා පවසා සිටියේය.

xii. 2024 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විගණකවරුන්ගේ පරීක්ෂාවේ දී මෙහි අලෙවියට තබා තිබූ සමහර භාණ්ඩ ඉවත් කරන ලෙස දැන්වූ බවත්, එම භාණ්ඩ සඳහා වන ඉහළ ලාභාන්තිකය සීමා වු බවත්, 2024 වර්ෂයේ පාසල පැවැත්වූ දින ගණන ඉතා සීමිත වු බවත්, කෙසේ වෙතත් අවම 10%-20% ත් අතර දළ ලාභාන්තිකයක් තබා ගනිමින් එම කටයුතු ඉදිරියට කරගෙන යන බවත් භාණ්ඩාගාරිකතුමා ප්‍රකාශ කළේය.

xiii. ආදි ශිෂ්‍ය සංගමයේ ආදායම් වැඩිකර ගැනීම සඳහා නව යෝජනාවන් ඇත්දැයි හිටපු උප භාණ්ඩාගාරික එම්. එස්. උපාලි මහතා අසා සිටියේය. ඊට පිළිතුරු දෙමින් භාණ්ඩාගාරික ප්‍රගීත් රුක්ෂාන් මහතා පවසා සිටියේ,

- cricket academy එක ආරම්භ කිරීම,
- විධායක සභාවේ උප සභාපතිවරයකුගේ ප්‍රධානත්වයෙන් කාර්‍යාලයේ විදුලි බිල අවම කිරීම සඳහා සෝලා පැනල සවිකිරීම,
- Mini tuck shop එකේ ආදායම වැඩි කර ගැනීම,
- පාසල් ටී ෂර්ට් ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති 2025/2026 වර්ෂ වලදි ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවයි.

xiv. පාසල පැවැත්වෙන කාල සීමාව තුල අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති රාමුව තුල කටයුතු කර, පාසල් කාලයෙන් පසු සවස් කාලයේ ඉහත සඳහන් කෙටි ආහර පාන අළෙවි කල නොහැකි ද? යන්න ආසිරි ද සොයිසා මහතා විමසා සිටියේය.

xv. එළෙස කල නොහැකි බවත්, එම නීතිය පාසල තුල ඕනෑම කාලයකට වලංගු බවත්, ප්‍රගීත් රුක්ෂාන් මහතා පවසා සිටියේය.

xvi. මෙහිදී අදහස් දක්වමින් ශාලක මුතුතන්ත්‍රී මහතා පවසා සිටියේ, මෙම නීතිය දීපාල් හේරත් මහතා සභාපතිවරයා ලෙස කටයුතු කරන අවදියේදීත් පැවති බවත්, නමුත් ප්‍රායෝගිකව ඒවා

ඉවත් කරනු ලැබුවේ මෙම (2024) වසරේදී බවයි. මෙලෙස ඉවත් කරනු ලැබූ භාණ්ඩ වැඩි වශයෙන් ළමුන් අතර අළෙවි වූ භාණ්ඩ බවත්, එම ඉවත් කිරීම ආදායම අඩුවීම සඳහා ඍජුවම බලපෑ බවයි.

xvii. කොළ කැද වැනි වෙනත් පෝෂණීය ආහාර වර්ගයන් විකිණීමට කටයුතු කිරීමට හැකි බව ආසිරි ද සොයිසා මහතා පවසා සිටියේය. ඒ පිළිබඳ වැඩිදුරටත් සොයා බලන බව භාණ්ඩාගාරිකතුමා ප්‍රකාශ කර සිටියේය.

xviii. තවද බාහිර විගණන ආයතනය සඳහා වූ මූල්‍ය වෙන් කිරීම අය වැය වාර්තාවේ පෙන්වා තිබුන ද, නැවත එම මුදල් ප්‍රතිපූරණයක් ලෙස සංගමය වෙත ලැබෙන බව පවසා සිටියේය.

## භාණ්ඩාගාරිකතුමා විසින් ඒකාබද්ධ ගිණුම් වාර්තාව විග්‍රහ කිරීම

I. තවදුරටත් භාණ්ඩාගාරිකතුමා ප්‍රකාශ කර සිටියේ සියලුම දශක හා අනුබද්ධ කණ්ඩායම් තම ගිණුම සුදුසුකම් ලත් බාහිර විගණකවරයෙකු ලවා විගණනය කරවා ගත යුතුයි. එහිදි ගිණුම් වර්ෂය ජනාවාරි 01 දින සිට එම වර්ෂයේ 2024 වර්ෂයේ දෙසැම්බර් 31 විය යුතු බව සිහිපත් කළේය.

II. තමා නියෝජනය කරන අරලිය කණ්ඩායමේ විගණන ගිණුම් වාර්තාව ජනවාරි 31 වෙනිදාට ප්‍රථම ලබාදීමට කටයුතු කළ බව එම්. එස්. උපාලි මහතා පවසා සිටියේය. තවදුරටත් ගිණුම් වාර්තා ලබානොදුන් හා අසම්පූර්ණ ගිණුම් වාර්තා අප්‍රේල් මස 30 වන දිනට ප්‍රථම සම්පූර්ණ කොට ආදි ශිෂ්‍ය සංගමයට භාර දෙන ලෙස ඉල්ලීමක් කළ භාණ්ඩාගාරිකතුමා, ඒ සඳහා වන ගිණුම් සේවාව ආදි ශිෂ්‍ය සංගමයේ නව ගිණුම් නිළධාරියාගෙන් ලබාගත හැකි බව ප්‍රකාශ කළේය.

III. මෙහිදි චමිදු විජයවර්ධන මහතා පවසා සිටියේ පෙර වසර වල දශක හා අනු කණ්ඩායම් වල භාණ්ඩාගාරිකවරුන් මාස තුනෙන් තුනට කැදවා සාකච්ඡා කල බවත්, මෙම වසරේදී එය සිදුනොවූ බවයි. ඉදිරියේදී නැවතත් එම කටයුත්ත ආරම්භ කිරීමටත්, whatsapp සමූහයක් ක්‍රියාත්මක කිරීමටත් තමා යෝජනා කරන බව පවසා සිටියේය. එම යෝජනාව ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ප්‍රගීත් රුක්ෂාන් මහතා පිළිතුරු දෙමින් පවසා සිටියේය.

IV. දශක කණ්ඩායම් ගිණුම සම්බන්ධව අරලිය කණ්ඩායම වෙත ලිපියක් ඉදිරිපත් කර තිබූ බවත්, අනෙක් කණ්ඩායම් සඳහා එය ක්‍රියාත්මක කලේද? යන්න උපාලි මහතා ප්‍රශ්න කර සිටියේය. එය පොදු අකෘතියක් අනුව සැකසුනු ලිපියක් බවත් සියලු දශක හා අනු කණ්ඩායම් වෙත එය යැවූ බවත් පිළිතුරු ලෙස ප්‍රගීත් රුක්ෂාන් මහතා පවසා සිටියේය.

V. දශක හා අනු කණ්ඩායම් වල මූල්‍ය භාවිතය පිළිබඳව ආදි ශිෂ්‍ය සංගමය මීට වඩා සැළකිලිමත් විය යුතු බවත්, මූල්‍ය නියාමනයන් තදින් ක්‍රියාත්මක විය යුතු බවත්, හිටපු විධායක සභාපති දීපාල් හේරත් මහතා තවදුරටත් පවසා සිටියේය. අරුණලු කණ්ඩායම විසින් වසර දෙකක සිට සාමාජික ගාස්තු අරමුදල් ඇපයට තබා ණය මුදලක් ලබාගැනීම පිළිබඳව අරුණලු සාමාජිකයකු ලෙස තමා ප්‍රශ්න කරන බවත් ප්‍රකාශ කර සිටියේ ය.

VI. සමහර දශක හා අනු කණ්ඩායම්වල මුදල් භාවිතයේ විනිවිද භාවයක් නැතැයි, දීපාල් හේරත් මහතා පෙරදි සඳහන් කල බවත් එම කණ්ඩායම් මොනවා ද? යන්න පැවසීමට හැකිදැයි පෙරමග කණ්ඩායමේ සභාපති සංජීව කාරියවසම් මහතා දීපාල් හේරත් මහතාගෙන් ප්‍රශ්න කර සිටියේය. එහිදී දීපාල් හේරත් මහතා පිළිතුරු දෙමින්, තමා සඳහන් කලේ අරුණලු හා සංසද කණ්ඩායම් දෙක පිළිබඳව පමණක් බවයි.

අවසානයේදි රේණුකා රාජපක්ෂ මහත්මියගේ යෝජනාවෙන් හා එම්. එස්. උපාලි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් 2024 වර්ෂයේ සදහා ගරු භාණ්ඩාගාරිකතුමා සභාවට ඉදිරිපත් කල විගණන ගිණුම් වාර්තාව සභා සම්මත විය.

## විදුහල්පතිනියගේ කතාව

- අද දින පාසල් භූමිය තුළ විභාග කටයුතු පැවතුන ද මහා සභා රැස්වීම පාසලේ ප්‍රධාන ශාලාවේ පැවැත්වීමට අවසරය ලබාදුන් අදාළ සියලු බලධාරීන්ට ස්තුතිය පුද කළාය.
- පාසලේ ක්‍රීඩාවේ හා අධ්‍යාපනයේ කඩා වැටීමක් ඇතැයි සමහරුන් තැන තැන අදහස් ප්‍රකාශ කරන බවත්, පාසලක අඩුපාඩු තිබිය හැකි බවත් ඒ සියල්ල අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරන බවත්, පාසලේ එවැනි කඩාවැටීමක් ඇති බව ඔවුන් පවසා නැති බවත් පවසා සිටියාය.
- පාසලේ පරිපාලන වැඩකටයුතු කරන්නේ සරල, සතුටුදායක පරිසරයක නොවන බවත් දෙමාපියන්ගෙන් පැමිණෙන ගැටලු විසදීම ඉතා දුෂ්කර බවත්, පාසල ක්‍රියා කල යුත්තේ යම්කිසි නියාමනයකට අනුව

බවත්, පාසලට ඇත්තටම ආදරයක් ඇත්නම් තැන තැන විවේචනය නොකොට අඩුපාඩු ඇත්නම් ඒවා තමන් වෙත පෙන්වා දෙන ලෙස ද පැවසීය.

- කුඩා කල සිට පාසලෙන් නිර්මාණය කරන ක්‍රීඩකයින් සියලු ජයග්‍රහණයන් ලබා උසස් පෙළ සඳහා අප පාසලෙන් ඉවත් වී වෙනත් පාසලකට යාමේදී එවන් සිසුන් වෙත no objection letter එකක් නිකුත් නොකරන බවත් පවසා සිටියේය.
- රගර් ක්‍රීඩාවෙන් ලංකාවේ 5 වන ස්ථානයට පත්වීම හා ලංකාවේ පාසල් අතර හොදම රගර් කණ්ඩායම් 12 ට එක්වීම සතුටට කරුණක් බවත්,
- මේ වන විටත් සයිබීරියාවේ පැවැත්වෙන ලෝක චෙස් තරගයට පාසලේ දරුවන් සහභාගී වී සිටින බවත්,
- කොළඹ කලාපයේ පාසලක් නොවුනත් සැමවිටම කොළඹ කලාපයේ පාසල සමග කටයුතු කරන බවත්,
- colours night , සංකලන , ත්‍යාග ප්‍රධානෝත්සවය වාර්ෂිකව පැවැත්වීමට අදහස් කරන බවත්,
- උසස් පෙළ කලා අංශයේ දිවයිනෙන් 3 වන ස්ථානයත්, කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානයත් බිහිකිරීමට අප විද්‍යාලයට හැකිවූ බවත්,
- උසස් පෙළ විභාගය සඳහා ඉදිරිපත් වූ සිසුන් අතරින් 226 දෙනෙක් විශ්ව විද්‍යාලයට තේරීපත්වීම අධ්‍යන කටයුතු වලින් ලැබූ ජයග්‍රහණයක් බවත්,
- 5 වසර දරුවන් සියලුදෙනාටම ශිෂ්‍ය නායක ලාංඡන පැළඳවීම දරුවන් කුඩා කළ සිට නායකත්වයට හුරු කරන කටයුත්තක් බවත්,
- සමනල සංකලන, Band show, ත්‍යාග ප්‍රධානෝත්සවය මෙම වසරේදී පැවැත්වීමට නියමිත බවත් ඒ සඳහා ආදි සිසුන්ගේ සහයෝගය ඉතා වැදගත් බවත්,
- පිහිනුම් තටාකය අප්‍රේල් 1 වන දින සිට නැවත විවෘත කිරීමට හැකිවන බව සියලුදෙනාටම සතුටින් දැනුම් දෙන බවත්,
- මාධ්‍ය ඒකක ගොඩනැගිල්ල ඇතුලු පන්ති කාමර 16ක් සඳහා අලුතින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුත්ත වෙනුවෙන් මූල්‍යාධාර සපයා ගැනීමේ අරමුණින් Maroon Fiesta Mega Carnival ව්‍යාපෘතිය 2025 ජනවාරි 16,17 හා 18 දින වල පැවත්වූ බවත්, එය සාර්ථක කරගැනීම සඳහා සංවිධාන කටයුතු වෙනුවෙන් දිවා රෑ වෙහෙසුන ආකාරය තමා දුටු බවත් පවසා සිටියාය. තවද සියලු දෙනාම සාමාන්‍ය මනුෂ්‍යයින් බවත් කිසි අයෙකුට සුවිශේෂී හිතක් හෝ මොළයක් පිහිටා නොමැති බවත්, සැම විටම ජය නොලැබෙන බවත් පරාජයත් අපට බලාපොරොත්තුවීමට සිදුවන බවත් පවසා සිටියාය.
- අප සියලු දෙනාම එක්ව පාසල දිනවීමට කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරමින් තම කථාව අවසන් කළාය.

## Maroon Fiesta Mega Carnival ව්‍යාපෘතිය - විධායක සභාපති ජීවන් ප්‍රියදර්ශණ මහතා

⋆ විධායක සභාපති ජීවන් ප්‍රියදර්ශන මහතා අදහස් දක්වමින් පාසලේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ සත් ක්‍රියාව වෙනුවෙන් Maroon Fiesta Mega Carnival 2025 ව්‍යාපෘතිය සංවිධානය කල බව පැවසීය. තම කණ්ඩායමට පාලනය කල නොහැකි බාහිර හේතූන් නිසා මෙම ව්‍යාපෘතිය අසාර්ථක වූ බවත්, ඉන් සංගමයට රුපියල් මිලියන 12 ක පමණ මූල්‍ය අලාභයක් සිදුවූ බවත්, තම ධූර කාලය තුලදී ඉදිරි ව්‍යාපෘති තුලින් මෙම අලාභය ප්‍රතිපූරණය කරන බවත් පවසා සිටියේය. තවද එම ප්‍රතිපූරණයන් සඳහා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් තම කණ්ඩායම ඒ වෙනුවෙන් වෙහෙසෙන බවත් ඊට සැම දෙනාගේම සහය බලාපොරොත්තු වන බවත් පවසන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා විධායක සභාව අනුමත කරනු ලදුව ලබාගත් රු. ලක්ෂ 86ක්ව තිබූ බැංකු අයිරාව මේ වන විට ක්‍රියාත්මක වන ව්‍යාපෘති නිසා ලක්ෂ 43 දක්වා අඩු කරගැනීමට හැකියාව ලැබී තිබෙන බවද එම මහතා පවසා සිටියේය.

⋆ මෙහිදී ප්‍රගීත් රැක්ෂාන් මහතා අදහස් දක්වමින් පවසා සිටියේ මෙම ව්‍යාපෘතියෙන් මිලියන 12 ක පමණ මූල්‍ය පාඩුවක් සිදුවූ බවත් ඉන් ලක්ෂ 86 ක් සංගමය සතු සාමාජික අරමුදල් ඇපයට තබා ලබාගත් බැංකු අයිරාව බවත්ය. විනෝද බද්ද සඳහා ගෙවූ මුදල් දින 60ක ඇතුළත නැවත අයකර ගැනීමට හැකියාව ලැබෙන බවත් ලොතරැයි ව්‍යාපෘතිය, මගින් ලැබුනු මුදල් බැංකු අයිරාව පියවීම වෙනුවෙන් යෙදූ බවත්, එම නිසා ලක්ෂ 43 දක්වා එය අඩු කරගැනීමට හැකියාව ලැබුනු බවත් සභාව දැනුවත් කරමින් පවසා සිටියේය.

⋆ තවද ලොතරැයි දිනුම් ඇදීම, එළඹෙන මහා ක්‍රිකට් තරගය, දම්පල් පා ගමන, ඉදිරි සාරා සංගීත ප්‍රසංගය හා ඒවාට සමාගාමී ප්‍රසංග, ටී ෂර්ට් අළෙවිය යන ව්‍යාපෘතීන් 5 ක් මගින් එම අලාභය ප්‍රතිපූරණය කිරීමට

බලාපොරොත්තු වන බවත් පවසා සිටියේය. ලොතරැයි ව්‍යාපෘතිය මගින් මිලියන 3 ක මුදලක් අපේක්ෂා කරන බව ද පවසා සිටියේය.

## ලොතරැයි ව්‍යාපෘතිය

ව්‍යාපෘති සභාපති ඉන්දික ප්‍රභාත් මහතා එම ව්‍යාපෘතිය පිළිබදව අදහස් දක්වමින් කියා සිටියේ ප්‍රථම ත්‍යාගය වෙනුවෙන් ලබාදෙන යතුරු පැදිය සඳහා වට්ටමක් ලැබී ඇති බවත්, ලොතරැයි පත් මුද්‍රණය සුරංග මහතාට අයත් දිමාංගි ප්‍රින්ටර්ස් ආයතනයෙන් නොමිලේ කරවා ගැනීමට හැකියාවක් ලැබුනු බවත්ය. එමෙන්ම මෙම ව්‍යාපාතිය සමාරම්භක දිනයේදි ලක්ෂ 08 පමණ ටිකට් පත් විකිණීමට හැකිවු බවත් මේ වන විට මිලියන 2.5 ක පමණ ආසන්න වටිනාකමින් යුතු ටිකට් පත් නිකුත් කර ඇති බවත් එම ටිකට්පත් වලින් 90% පමණ මුදල් ලෙස ලැබෙන බව තමාගේ විශ්වාසය බවත් ප්‍රකාශ කර සිටියේය.

ටිකට්පත් අළෙවිය වෙනුවෙන් සියලු දෙනාගේම සහය බලාපොරොත්තුවන බවත් පවසා සිටියේය.

## ටී ෂර්ට් ව්‍යාපෘතිය

ඉදිරි වර්ෂය තුළ, දම්පල් පාගමන හා ක්‍රිකට් තරගය ඉලක්ක කරගනිමින් ටී ෂර්ට් 3000 ක් පමණ, පාසල් දරුවන් හා ආදි සිසුන් අතර විකිණීමට බලාපොරොත්තු වන බවත්, දැනටමත් ටී ෂර්ට් 207 ක් අළෙවි වී ඇති බවත් ජීවන් ප්‍රියදර්ශන මහතා පවසා සිටියේය.

## වෙනත්

විධායක සභාපති ජීවන් ප්‍රියදර්ශණ මහතා තවදුරටත් ප්‍රකාශ කරමින්,

- මාස 6කින් අතුරු මහා සභාවක් කැදවීමට බලාපොරොත්තු වන බවත්,එහිදි 2025 වර්ෂයේ මුල මාස 06 සඳහා වන අතුරු මූල්‍ය ගිණුම් වාර්තාවක් ඉදිරිපත් කරන බවත්,
- ඉදිරි සාරා ප්‍රසංගයේ සැලසුම් සභාවට ඉදිරිපත් කිරීම අපේක්‍ෂා කරන බවත්,
- එසේම pepsi සමාගමෙන් ලැබිය යුතු අනුග්‍රාහක මුදල් සාරා ප්‍රසංගය වෙත ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදි.

සාමාජිකයින්ගේ ලිඛිත අදහස් හා යෝජනාවන් කිසිවක් මෙම රැස්වීම පැවැත්වීමට පෙර ආදි ශිෂ්‍ය සංගමයට ලැබී නොමැති බව ප්‍රධාන ලේකම් චරිත් ලියනගේ මහතා පවසා සිටියේය.

නව අදහස් හා යෝජනා ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ජීවන් ප්‍රියදර්ශණ මහතා සභාවට දැන්වීය.

## අදහස් හා යෝජනා

- සීතා විජේසේකර මහත්මිය අදහස් දක්වමින් 1999 වසරේ මුල්පෙළ පාලියෝ කණ්ඩායම ආරම්භ කල බවත්, එතැන් සිට පාසලේ බුදු මැදුරේ සියලුම අලුත්වැඩියා කටයුතු තම කණ්ඩායම විසින් සිදුකල බවත් පවසා සිටියාය. බුදු මැදුරේ කොන්ක්‍රීට් වහලය තුළින් වැහි ජලය කාන්දු වන බවට සැලවීමෙන් ඊට ඉහලින් පිටතට නොපෙනෙන ලෙස වහලයක් සවිකරදුන් බවත් සභාව දැනුවත් කරමින් කියා සිටියාය.
- තම කණ්ඩායමවත් දැනුවත් නොකොට බුදු මැදුර ඉදිරිපස බෝ පැලයක් සිටුවා ඇතිබවත්, අප ආදි ශිෂ්‍ය, ජ්‍යෙෂ්ඨ උද්භිද විද්‍යාඥ භාතිය සුමිත්‍රාරච්චි මහතා සමග මේ පිළිබදව සාකච්ඡා කිරීමේදී ද ඔහු කියා සිටියේ මෙම බෝ පැලය මේ ස්ථානයට නුසුදුසු බව යන්නත්, බෝ පැලය මෙම ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයක රෝපනය කිරීමට තම කණ්ඩායම ඉදිරිපත් වන බවත් ඊට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම යෝජනාවක් ලෙස ඉදිරිපත් කර සිටියාය.
- එමෙන්ම මෙය නැවත රෝපනය කරන්නේ කොතැන ද? යන්න ගැන තවදුරටත් සාකච්ඡා කිරීමට කාලයක් ලබාදෙන ලෙසද පැවසුවාය.
- ඊට පිළිතුරු දෙමින් විදුහල්පතිතුමිය පවසා සිටියේ ඒ සඳහා තමාගේ විරුද්ධත්වයක් නැති බවයි.
- එමෙන්ම ධර්මපාල පිළිරුවේ පාදම කැඩීයාම සම්බන්ධව ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රවීන ශිල්පියෙකුගේ සේවය ලබාගත් බවත් ඒ සඳහා රුපියල් 60,000/- ක පමණ මුදලක් වැයවන බවත් පවසා සිටියාය. පාසල විසින් පත්කර ඇති කමිටුවේ අදහස වන්නේ නව පිළිමයක් ඉදිකිරීම යෝග්‍ය බවත් යන්නත්, නීල් ඩයස්, රවිබන්ද්‍ර විද්‍යාපති, භාරත ද සිල්වා යන අයගේ මූලිකත්වයෙන්

කමිටුවක් පත්කර පිළිම නිර්මාණකරුවෙකු ගෙන්වා දම්පල් සතියට පෙර එය නිම කිරීමට බලාපොරොත්තු වන බවත් එතුමිය දන්වා සිටියාය.

- හිටපු සභාපතිනියක් මෙන්ම අනුශාසකවරියක් වන හේමමාලිනී රූපසිංහ මහත්මියගේ යෝජනාවකට අනුව දම්පල් උයන නැවත ප්‍රතිසංස්කරනය කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා අවශ්‍ය පැළ ආදි ශිෂ්‍යයකු විසින් ලබාදෙන බවත් හා ඒ සඳහා ශ්‍රම දායකත්වය සාමාජිකයින්ගෙන් බලාපොරොත්තු වන බවත් එතුමිය පැවසීය.
- මීට අදහස් දක්වමින් ගයාන් රුක්ෂාන් මහතා පවසා සිටියේ ප්‍රතිමා සංරක්ෂණ ක්‍රමය යටතේ සංරක්ෂණ ශිල්පියකු ගෙන්වා පැරණි පිළිමය රැකගැනීමට උත්සාහ කිරීම වඩා යෝග්‍ය බවයි.
- මෙහිදී විදුහල්පතිතුමිය ගයාන් රුක්ෂාන් මහතාට එම කමිටුවට සහභාගි වන ලෙසට ආරාධනා කර සිටියේය.
- තවදුරටත් අදහස් දක්වමින් ගයාන් රුක්ෂාන් මහතා කියා සිටියේ මාධ්‍ය ගොඩනැගිල්ල ගිණිගැනීමෙන් අනතුරුව ගිණිගත් භාණ්ඩ වෙනුවට මාධ්‍යය සංසදය විසින් පරිත්‍යාග කරන ලද භාණ්ඩ තමා විසින් පාසලට බාරදුන් බවය.
  එමෙන්ම දම්පල් විත්ති පුවත්පත දැන් පල නොකරන්නේ ඇයි දැයි ද වසර 2කින් එය පළ නොකල බවද, E document එකක් ලෙස හෝ ප්‍රකාශ කිරීමට නොහැකිවූයේ මන්දැයි ද? යන්නත්, ඒ සඳහා මව් සංගමයට කාලවේලාවක් නැත්නම් මාධ්‍ය සංසදයට එය බාරදෙන ලෙසත්, ඒ මහතා සඳහන් කර සිටියේය.
  ඊට පිළිතුරු දෙමින් ගරු ප්‍රචාරක ලේකම් ධනංජ ඇල්විටිගල මහතා කියා සිටියේ ඉදිරි වසරේදී දම්පල් විත්ති පුවත්පත පළ කරන බවත් දැනටමත් එහි කටයුතු සිදුකරමින් පවතින බවත්ය.
- පුවත්පත් වලට වඩා සමාජ මාධ්‍යයන් ප්‍රබල බවත්, පුවත්පත් මුද්‍රණ කටයුතු සඳහා රුපියල් ලක්ෂ 2 පමණ මුදලක් වැයවන බවත්, තැපැල් ගාස්තු වශයෙන් රුපියල් 120,000/- ක් පමණ වැයවන බවත් එම නිසා මුද්‍රිත මාධ්‍යයන් අවම කිරීමට තීරණය කල බවත් හිටපු විධායක සභාපති දීපාල් හේරත් මහතා ප්‍රකාශ කර සිටියේය.
- දම්පල් විත්ති පුවත්පත විද්‍යුත් පුවත්පතක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට තමා යේජනා කරන බවත්, විද්‍යාලයේ තොරතුරුත් මෙමගින් පළ කිරීමට හැකියාවක් ඇති බවත් හිටපු ප්‍රධාන ලේකම් ආසිරි ද සොයිසා මහතා පවසා සිටියේය.
- ඊට පිළිතුරු දෙමින් විදුහල්පතිතුමිය පවසා සිටියේ දැනටමත් ඡායාරූප සංගමය හා මාධ්‍ය අංශය සමාජ මාධ්‍යයන් හරහා විද්‍යාලයේ තොරතුරු, සතියක් තුළදී මුදාහරින බවයි.
- දම්පල් විත්ති පුවත්පත, ආදි ධර්මපාලයීය මාධ්‍ය සංසදය සමග එක්වී සිදුකිරිමට තමා යෝජනා කරන බව ආසිරි ද සොයිසා මහතා දන්වා සිටියේය.
- මාධ්‍ය සංසදයේ නිළධාරියෙකු මේ සඳහා සම්බන්ධ කරගැනීමට එකග වන බවත්, යම් පුද්ගලයෙකුට පුවත්පතේ මුද්‍රිත පිටපතක් අවශ්‍යනම් මුදල් ගෙවා ලබා ගත හැකි බව චරිත් ලියනගේ මහතා සභාවට පවසා සිටියේය.
- පාසල් නිල ලාංඡනයේ රන් පැහැයට තමා කැමති නමුත් මුද්‍රණයේදී ගැටලු ඇතිවන බවත් ලාංඡනය පෙර මෙරූන් හා දම් පැහැයෙන් පැවති බවත් මේ සඳහා නිශ්චිත යෝජනාවකට යාම සුදුසු බවත් සනත් ලසන්ත මහතා පවසා සිටියේය.
- ඊට පිළිතුරු දෙමින් විදුහල්පතිතුමිය කියා සිටියේ 2023 වසරේදී මේ පිළිබඳව සාකච්ඡා කොට පාසල් ලාංඡනය හා ධජය තිබිය යුතු ආකාරය ගැන අවසන් තීරණයකට පැමිණි බවත් ඒ පිළිබඳව තොරතුරු දැක්වෙන අත්පොත සභාවට පෙන්වීය.
- මේ පිළිබඳව තවදුරටත් අදහස් දක්වමින් ගරු ප්‍රචාරක ලේකම් ධනංජ ඇල්විටිගල මහතා පවසා සිටියේ (maroon) දම් පාටින් මුද්‍රණය කරවිට එය නිසියාකාරව නොපෙනෙන බවත් මුද්‍රණයේදී වැඩි මුදලක් වැයවෙන නමුත් ව්‍යාජ මුද්‍රණ හදුනාගැන්මට හැකිවන බවයි. පාසලේ හා විධායක සභාවේ අනුමැතිය මත මෙය සිදුවූ බවත් පැවසීය.
- මාර්ගෝපදේශ පොතේ තමාගේ නම සඳහන් වූවත් එම කමිටුව සඳහා විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය හා තමා ප්‍රායෝගිකව ඊට සහභාගී නොවූ බව සනත් ලසන්ත මහතා කියා සිටියේය.
- වසර 5 කාලයක් තුළ සාකච්ඡා කොට අදහස් ලබාගත් අයගේ ද නම් මෙහි සඳහන් කර ඇති බව පවසමින් ධනංජ ඇල්විටිගල මහතා ඊට පිළිතුරු දුන්නේය.
- වෙනුර කසුන්සිරි මහතා යෝජනා කොට සිටියේ, Maroon fiesta mega carnival ව්‍යාපෘතිය වෙනුවෙන් සාමාජික අරමුදල් තැන්පතු මුදල ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීම සාමාජික මුදල් වියදම් කලා හා සමාන බවත් පවසා සිටි අතර, ලබාගත් බැංකු අයිරාව සම්පූර්ණයෙන්ම පියවීමෙන්

පසුව එවැනි දෑ මින් මතුවට කිරීමට නොහැකි වන සේ ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කළ යුතු බවයි.

- මෙම යෝජනාව ගරු විධායක සභාවට ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ගරු භාණ්ඩාගාරික ප්‍රගීත් රැක්ෂාන් මහතා ඉල්ලා සිටියේය.
- මෙලෙස ණය මුදලක් ලබා ගැනීමට අනුමැතිය ලැබුණේ දැයි වෙනුර කසුන්සිරි මහතා ප්‍රශ්න කර සිටියේය.
- බැංකු අයිරාව ලබාගැනීම සම්බන්ධව විශේෂ විධායක සභා රැස්වීමක් 2025-01-12 වන දින පවත්වා ඊට සහභාගී වූ පිරිසගේ ඒකමතික අනුමැතියට යටත්ව, මෙය නිසි අවසරය මත සිදුකළ බව ප්‍රධාන ලේකම් චරිත් ලියනගේ මහතා පැවසීය.
- ඉදිරි ව්‍යාපෘති සඳහා මෙය පූර්වාදර්ශයක් නොවිය යුතු බවත් වෙනුර කසුන්සිරි මහතා සඳහන් කලේය.
- නයෝමාල් ඉඹුලාන මහතා විසින් පාසල් ක්‍රීඩාපිටියේ නවීකරණයට පෙර පැවති ආකාරයත්, නවීකරණයට පසු තිබූ ආකාරයත්, වර්තමානයේ පවතින ආකාරයත් දැක්වෙන ඡායාරූප ප්‍රක්ෂේපන යන්ත්‍රය ආධාරයෙන් සභාවට ඉදිරිපත් කරන ලදි. වර්තමානයේදී ක්‍රීඩා පිටියේ පවතින වළ, ගොඩැලි තත්ත්වයන් නිසා ක්‍රීඩකයන් හට අනතුරු සිදුවීමට ඇති හැකියාව වැඩි බව පවසා සිටියේය. ඉදිරියේදී මේ පිළිබඳව සොයාබලා වහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.
- ක්‍රීඩා පිටිය පාසලට බාරදී අවසන් බවත්, දැන් එය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දේපළක් බවත් දීපාල් හේරත් මහතා ඊට පිළිතුරු වශයෙන් පවසා සිටියේය.
- තවද විදුහල්පතිතුමිය පවසා සිටියේ දිනපතා දරුවන් මෙහි ක්‍රීඩා කරන හෙයින් තණකොළ වැවීමට කාලයක් නොලැබෙන බවයි. එසේනම් ක්‍රීඩාපිටිය ක්‍රිකට් වලට පමණක් ලබාදී අනෙක් ක්‍රීඩා සඳහා විකල්ප ස්ථානයක් යොදාගත යුතු බවයි. පාසල් කළමනාකරණ කමිටුව සමග සාකච්ඡා කර මේ සඳහා තීරණයක් ගන්නා බවත් එතුමිය පවසා සිටියාය.
- ක්‍රීඩා පිටිය පරිස්සම් කර ගැනීම පුහුණුකරුවන්ගේ ද වගකීමක් බැවින් ඔවුනුත් මේ සඳහා සම්බන්ධ කරගන්නා මෙන් නයෝමාල් ඉඹුලාන මහතා ඉල්ලා සිටියේය.
- ක්‍රීඩා පිටියේ කටයුතු වෙනුවෙන් තාක්ෂණික කමිටුවක් තිබෙන නිසා ඊට පරිබාහිරව කටයුතු කිරීම යෝග්‍යදැයි ජීවන් ප්‍රියදර්ශණ මහතා විමසා සිටියේය.
- Maroon fiesta mega carnival ව්‍යාපෘතිය පිළිබඳව තව දුරටත් සාකච්ඡා කිරීම සඳහා විශේෂ මහා සභාවක් ඉල්ලා අත්සන් සහිත ලිපියක් ගයාන් රැක්ෂාන් මහතා විසින් ගරු ලේකම් චරිත් ලියනගේ මහතා හට බාරදෙන ලදි.
- චාන්දනී වේරගල මහත්මියගේ ඉල්ලීම පරිදී එම ලිපිය චරිත් ලියනගේ මහතා විසින් කියවන ලද අතර තත්කාලීන ව්‍යවස්ථාවේ 22.02.01 වගන්තිය ද සභාවට ඉදිරිපත් කරන ලදි. ව්‍යවස්ථාවට අනුව ලිපිය ලැබී දින 21 තුල විධායක සභා අනුමැතිය සහිතව රැස්වීම පැවැත්විය යුතු බවත්, එම දින ගණන වන විට අවුරුදු නිවාඩුව යෙදෙන නිසා සාමාජික සහභාගීත්ව පිළිබඳ ගැටලු පැන නැගිය හැකි බැවින් අප්‍රේල් මස අග සතියේ පැවත්වීමට සුදුසු බව ගරු ප්‍රධාන ලේකම්තුමා විසින් යෝජනා කරන ලද අතර විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීම සහ මෙසේ දින වෙනස් කිරීම පිළිබඳව විධායක කමිටු අනුමැතිය ලබාගත යුතු බවත් ප්‍රකාශ කළේය.
- මෙහිදි නැගී සිටි සියසර කණ්ඩායමේ ගරු ලේකම්තුමිය වන විජිනි පෙරේරා මහත්මිය අප්‍රේල් 27 වන ඉරු දින "දම්පල් කොවුල් නද" ව්‍යාපෘතිය පැවැත්වෙන බැවින් මෙම විශේෂ සභා රැස්වීම එම දිනට යොදා නොගන්නා ලෙස ඉල්ලීමක් කළාය. කෙසේ වෙතත් අප්‍රේල් මස අග සතියේ හෝ මැයි මස මුල සතියේ ඉරු දින යෝජිත විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට ලිපිය භාරදුන් ගයාන් රැක්ෂාන් ප්‍රමුඛ කණ්ඩායම එකග විය.
- එම ව්‍යාපෘතියට අදාළව කෙටුම්පත් ගිණුම් වාර්තාව මේ මොහොතේ වුවත් තමාට ඉදිරිපත් කල හැකිබව ප්‍රගීත් රැක්ෂාන් මහතා පවසා සිටියේය.

දැන් සභාව තුළ සනපූර්ණයක් නොමැති හෙයින් හා කාල වේලාව බොහෝ සෙයින් ඉක්ම ගොස් ඇති නිසා, එය අනවශ්‍ය බව නියෝජ්‍ය ලේකම් චාන්දනී වේරගල මහත්මිය පවසා සිටියාය.

2024 වර්ෂයේ විධායක කමිටුව විසින් යෝජනා කරන ලදුව පත්වූ විනය කමිටුව 2025 වර්ෂයේ එලෙසම ක්‍රියාත්මක වන බව ප්‍රධාන ලේකම්තුමා විසින් සභාවට දැනුම් දුන් අතර එහිදි වත්මන් විනය කමිටු සාමාජික සාමාජිකාවන්ගේ නම් නැවත වරක් සභාවේ ප්‍රකාශ කොට ස්ථිර කරන ලදි.

එසේම 2024 වර්ෂයේ යෝජනා කරන ලදුව පත්කරගන්නා අභ්‍යන්තර විගණන කමිටුවම 2025 වර්ෂයේත් කටයුතු කරන බව ප්‍රධාන ලේකම්තුමා විසින් සභාවට දැනුම් දීමෙන් අනතුරුව එම කමිටුවේ සාමාජික සාමාජිකා නාම ලේඛනය ද නැවත වරක් සභාවේදි ප්‍රකාශ කර ස්ථිර කරන ලදි.

අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත අනුශාසක මණ්ඩල සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වූ හේමාංගනී කිරිවත්තුඩුව මහත්මිය වෙනුවට අනුශාසක මණ්ඩල සාමාජිකයෙකු පත්කිරිම එලඹෙන පළමු විධායක සභාවේදී යෝජනා කිරීමට ද සභාවේ අනුමැතිය හිමිවිය.


**2025 වර්ෂය සඳහා බාහිර විගණකවරයෙකු යෝජනා කිරීම**

⋆ මේ සඳහා HMW Association (වරලත් ගණකාධිකාරවරු හා විගණකවරුන්) ආයතනය නැවත වරක් සුදුසු යැයි දීපාල් හේරත් මහතාගේ යෝජනාවෙන් හා ආසිරි ද සොයිසා මහතාගේ ස්ථිරත්වයෙන් අනුමත කරගන්නා ලදි.

## 77.16 ගරු ප්‍රධාන ලේකම්තුමාගේ ස්තුති කතාව - චරිත් ලියනගේ මහතා

මහා සභාවට පැමිණි සියලු දෙනාගෙන් අවසර පැතු ප්‍රධාන ලේකම්තුමා විභාගයක් පැවැත්වෙන කාල සීමාව තුළදි විද්‍යාලයේ ප්‍රධාන ශාලාව අප වෙත ලබාදීම හා ආදි ශිෂ්‍ය සංගමය සමග ඉතාමත් සුහදව කටයුතු කිරීම පිළිබඳව ගරු විභාග ශාලාධිපතිතුමා වෙතත්, එම කටයුත්ත සම්බන්ධීකරණය හා ආදි ශිෂ්‍ය සංගමයේ කටයුතු වෙත නිරතුරුවම සහයෝගය දක්වන ගරු විදුහල්පතිතුමිය වෙතත්, Maroon fiesta mega carnival ව්‍යාපෘතිය සඳහා විශාල ශක්තියක් වෙමින් සහයෝගය දැක්වූ ප්‍රදේශය භාර ගරු පාර්ලිමේන්තු මන්ත්‍රි දේවානන්ද සුරවීර මහතාටත්, මහරගම නගර සභාවේ කාර්යය මණ්ඩලයටත්, බස්නාහිර පළාත් අණ්ඩුකාර කාර්යාලයේ කාර්ය මණ්ඩලයටත්, ස්තුතිය පුද කරන අතර ප්‍රසංගය අතරමග නතර කර දමූ කාර්ය හැර අනෙක් කටයුතු වලිදි සහයෝගය දැක්වූ මහරගම පොලිස් ස්ථානයටත්, නිබඳවම ආදි ශිෂ්‍ය සංගමයේ කටයුතු වෙනුවෙන් සහයෝගය දක්වන ආදි ශිෂ්‍ය සංගමයේ කාර්ය මණ්ඩලයටත්, පාසලේ උන්නතිය වෙනුවෙන් කටයුතු කල සියලු ආදි ශිෂ්‍යයින් හා දෙමාපියන්ටත් ස්තුතිය පුද කරමින් තම කතාව අවසන් කරන ලදි.

මෙයට



ප්‍රධාන ලේකම්
චරිත් ඉන්දික ලියනගේ